# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල



## 2025 වසර සඳහා සැපයුම්කරුවන් සහ සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

2025 වසර සඳහා කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා වැඩ, සැපයුම් හා සේවා ලබා ගැනීම පිණිස 2025 වර්ෂය වෙනුවෙන් ලියාපදිංචි වීමට කැමති පිළිගත් නිෂ්පාදකයන්ගෙන් /දේශීය ඒජන්තවරුන්ගෙන්/ සැපයුම්කරුවන්ගෙන් / සේවා සැපයුම්කරුවන්ගෙන් සහ කොන්ත්‍රාත්කරුවන්ගෙන් පහත දැක්වෙන සැපයුම් හා සේවා සැපයීම සඳහා කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වීම පිණිස 2024.12.31 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01 සැපයුම්

I. සියළුම වර්ගයේ ලිපිද්‍රව්‍ය ,පරිගණක ලිපිද්‍රව්‍ය (ටෝනර්) හා කාර්යාලයීය අවශ්‍යතාවයන්
II. පරිගණක, පරිගණක උපාංග,මෘදුකාංග හා දෘඩාංග
III. කාර්යාලීය හා ගෘහ උපකරණ (වානේ,ප්ලාස්ටික්,ෆයිබර්,ලී,විදුලි ආදිය)
IV. විද්‍යුත් හා යාන්ත්‍රික උපකරණ (යතුරු ලියන, ඡායා පිටපත් යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර ආදිය)
V. රාජකාරී නිල ඇඳුම්,ටී ෂර්ට් මැසීම හා තිර රෙදි මසා සැපයීම.
VI. සම් බෑග්, පාවහන්, වැහි කබා සහ කුඩ
VII. විද්‍යුත් මෙවලම් (වයර්, විදුලි ජේනු ආදී විද්‍යුත් මෙවලම්)
VIII. ප්ලාස්ටික් වැඩ, නාම පුවරු, රබර් මුද්‍රා,පොත් බැඳීම්, ඩිජිටල් ප්‍රින්ටින්,ෆයිබර් නිෂ්පාදන සහ මුද්‍රණ කටයුතු
IX. ටයර්, ටියුබ් සහ වාහන බැටරි
X. මෝටර් රථ අමතර කොටස්
XI. කළුගල් හා ඒ ආශ්‍රිත ප්‍රාථමික නිෂ්පාදන (මැටල්, ගල්කුඩු, චිප්ස් ආදිය)
XII. අංගන ගත ද්‍රව්‍ය (සාමාන්‍ය ගඩොල්/පතුරු ගඩොල්/වැලි/බොරලු/පස් ආදිය)
XIII. සිමෙන්ති ආශ්‍රිත නිෂ්පාදන (අන්තර්බන්ධිත ගල්/ කොන්ක්‍රීට් කණු/ කොන්ක්‍රීට් ගල්/මල් පෝච්චි ආදිය)
XIV. හාඩ්වෙයාර් අයිතම
XV. පෙරමුසු කොන්ක්‍රීට් සැපයීම
XVI. ක්‍රීඩා සහ සුභසාධන භාණ්ඩ
XVII. පුස්තකාල පොත්, සඟරා,වාර ප්‍රකාශන සහ වෙනත් ප්‍රකාශන
XVIII. සංගීත භාණ්ඩ හා නර්තන කණ්ඩායම්
XIX. මිනිස් ආහාර සඳහා පිසූ ආහාර සැපයීම
XX. මිනිස් ආහාර සඳහා වියලි ආහාර සැපයීම
XXI. ශ්‍රව්‍ය / දෘශ්‍ය උපකරණ සැපයීම
XXII. ගිනි නිවීමේ උපකරණ හා අනෙකුත් ආරක්ෂණ උපකරණ
XXIII. ආයතනික හැඳුනුම්පත් සැපයීම
XXIV. විදුලි උපකරණ සැපයීම (වතුර මෝටර්, ජෙනරේටර්, අධිශීතකරණ, වායුසමීකරණ ආදිය)
XXV. සියලුම කෘෂි උපකරණ (උදලු,අලවංගු,විල්බැරෝ,රේක්ක ආදිය)
XXVI. පශු සම්පත් (කුකුළු පැටවුන්, මාළු පැටවුන්, කිරි ගවයින් ආදී ජීවී සතුන්)
XXVII. ධීවර ආම්පන්න
XXVIII. ස්වභාවික මල් හා මල් සැරසිලි
XXIX. දැව සැපයීම දේශීය/විදේශීය
XXX. කැනපි හට්/කූඩාරම්/තහඩු ආවරණ ආදිය
XXXI. සියලුම වානේ අයිතම
XXXII. සියලුම තීන්ත අයිතම
XXXIII. සියලුම සෙරමික් අයිතම
XXXIV. සියලුම ඇලුමිනියම් අයිතම
XXXV. සමරු ඵලක සහ ගල් කැටයම්
XXXVI. ළමා උද්‍යාන සඳහා උපකරණ (ඔංචිල්ලා / සීසෝ / සෙල්ලම් බඩු / ශරීර සුවතා උපකරණ ආදිය)
XXXVII. සූර්ය පැනල හා ඒ ආශ්‍රිත උපකරණ සැපයීම

XXXVIII. ගෙවතු වගා කටයුතු හා අලංකරණය සඳහා අවශ්‍ය පැළ වර්ග සැපයීම
XXXIX. සෙව්ලි අයිතම
XL. ස්වයං රැකියා උපකරණ (සැපයිය හැකි ස්වයං රැකියා උපකරණ මොනවාද? එම උපකරණ නිෂ්පාදනය කරනවාද නැතිනම් අලෙවිය පමණක්ද යන වග සඳහන් කළ යුතුය)
XLI. වායු තුවක්කු සැපයීම
XLII. රූපලාවන්‍යාගාර උපකරණ
XLIII. පානීය ජල සැපයීම හා දියර කිරි සැපයීම
XLIV. ජල පිරිසිදු කිරීම හා ඒ ආශ්‍රිත උපකරණ
XLV. ඇඟිලි සලකුණු යන්ත්‍ර සැපයීම
XLVI. සියලුම වීදුරු අයිතම
XLVII. පොලිසැක් උර
XLVIII. කෘෂිකාර්මික ධාන්‍ය බීජ (වී,බඩඉරිගු ආදිය)
XLIX. ටයිල් සැපයීම.
L. ඔසුසැල්
LI. බේකරි
LII. බුමුතුරුණු(කාපට්) සහ පාපිසි සැපයීම.
LIII. හෝටල් සහ තානායම්
LIV. පෝසිලේන් අයිතම

## සේවාවන් හා වැඩ

I. ගොඩනැගිලි ඉදි කිරීම, අලුත්වැඩියාවන් හා නඩත්තු කටයුතු
II. මහා මාර්ග ඉදිකිරීම් හා අලුත්වැඩියා කටයුතු
III. ගොඩනැගිලි විදුලි පද්ධති අලුත්වැඩියා කටයුතු
IV. ජලනල පද්ධති අලුත්වැඩියා කටයුතු

**සබරගමුව පළාත තුළ CIDA ලියාපදිංචිය සහිත කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතුය.**

V. වැව්, අමුණු,ඇළ වේලි ඉදිකිරීම හා අලුත්වැඩියා කටයුතු
VI. බර වාහන හා ඉඩම් වාහන සැපයීම (බැකෝ යන්ත්‍ර, ගල්රෝල්, කැටපිලර්, පස්තලන යන්ත්‍ර, ට්‍රැක්ටර්)
VII. කාර්යාල සුළු නඩත්තු කටයුතු
VIII. වාහන සුළු අලුත්වැඩියා, එන්ජින් අලුත්වැඩියා කටයුතු
IX. වාහන ටින්කරින් කිරීම හා පින්තාරු කිරීම
X. වාහන විදුලි පද්ධති අලුත්වැඩියා කිරීම
XI. එලයිමන්ට් පරීක්ෂා කිරීම හා වීල්බැලන්ස් කිරීම
XII. වාහන සේවා කිරීම

**කෑගල්ල, කුරුණෑගල, මහනුවර දිස්ත්‍රික්ක වල ලියාපදිංචි සැපයුම්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතුය.**

XIII. වාහන වායුසමීකරණ අළුත්වැඩියා කිරීම.
XIV. වාහන හා කාර්යාල උපකරණ කුෂන් කිරීම
XV. බැනර්,පෝස්ටර්,පොත් මුද්‍රණ සහ පොත් බැඳීම් කටයුතු
XVI. කාර්යාලීය හා ගෘහ උපකරණ අලුත්වැඩියා කිරීම
XVII. විදුලිය හා විද්‍යුත් උපකරණ අලුත්වැඩියා කිරීම
XVIII. කාර්යාලීය උපකරණ අලුත්වැඩියා කිරීම(යතුරු ලියන, ඡායා පිටපත් යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර)
XIX. පරිගණක/පරිගණක උපාංග හා පරිගණක මුද්‍රණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම
XX. භාණ්ඩ හා මගී ප්‍රවාහන කටයුතු සඳහා වාහන සැපයීම (කාර්, වෑන්, ජීප්,ලොරි, බස් ආදිය)
XXI. අභ්‍යන්තර දුරකථන පද්ධති, ජංගම දුරකථන පහසුකම් හා අන්තර්ජාල පහසුකම් සැපයීම
XXII. පුහුණු හා නුපුහුණු කම්කරු සේවා සැපයීම
XXIII. කාර්යාල ගොඩනැගිලි, කාර්යාල භූමි පිරිසිදු කිරීම් සේවා සැපයීම
XXIV. ආරක්ෂක සේවා සැපයීම
XXV. උපදේශන සේවා සැපයීම.(වාස්තු විද්‍යාව, විදුලි පද්ධති සම්බන්ධ )
XXVI. වායුසමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම
XXVII. වඩු/පෙදරේරු සේවා සැපයීම
XXVIII. ඇලුමිනියම් දොර/ජනෙල්/හකුලන දොරවල් සැපයීම හා සවිකිරීම් කටයුතු
XXIX. සියලුම වානේ නිෂ්පාදන (ග්‍රිල්/ගේට්ටු ආදිය)
XXX. ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය කුලී පදනම මත සැපයීම (විදුලි ජනක යන්ත්‍ර/කොන්ක්‍රීට් මික්සර්/ස්කෘ ජැක්/පලංචි)
XXXI. කෘමි මර්දනය (වේයන්,මැස්සන්,කුහුඹුවන් ආදිය)
XXXII. කුලී පදනම මත වේදිකා, පුටු, පැරබෝල් හට්, සැරසිලි ආදී උත්සව භාණ්ඩ
XXXIII. ශබ්දවාහිනී යන්ත්‍ර කුලී පදනම මත සැපයීම
XXXIV. CCTV කැමරා සපයා සවිකිරීම

XXXV. සූර්ය පැනල හා ඒ ආශ්‍රිත සැපයීම
XXXVI. විෂබීජ නාශක දියර, මුව ආවරණ,අත් ආවරණ ඇතුළු සනීපාරක්ෂක ද්‍රව්‍ය
XXXVII. දේශන ශාලා සහ නවාතැන් පහසුකම් සැපයීම
XXXVIII. පරිගණක/පරිගණක උපාංග කුලී පදනම මත සැපයීම
XXXIX. ලොන්ඩරි (තිර රෙදි සේදීම් ආදී කටයුතු සඳහා)

සේවාවන් යටතේ I,II,III,IV,V හි ලියාපදිංචිය අපේක්ෂා කරන අයදුම්කරුවන්(සබරගමුව පළාත තුල ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ) ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තයේ නියැලීම සඳහා ඉදිකිරීම් අභ්‍යාස හා සංවර්ධන ආයතනයේ (CIDA) ලියාපදිංචි වී ඇති සීමාවන් දැක්වෙන සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතුය.

වාහන අළුත්වැඩියා කිරීම් සම්බන්ධයෙන් ඇති අයිතමයන්හි ලියාපදිංචිය සිදු කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඔබ ආයතනය සතු පුහුණු කාර්යය මණ්ඩලයේ සුදුසුකම් සම්බන්ධ විස්තර හා ආයතනය සතු උපකරණ හා මෙවලම් පිළිබඳ විස්තර ඉල්ලුම්පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතුය.

අයිතම ගණනාවක් සඳහා ලියාපදිංචිය අපේක්ෂා කරන අයදුම්කරුවන් එක් අයිතමයක් සඳහා රු.500.00 බැගින් ආපසු නොගෙවන තැන්පත් මුදලක් දිවයිනේ ඕනෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට රජයේ ආදායම් ශීර්ෂ **2003.99.00** ට බැර කර ලබා ගත් පොදු 172 කුවිතාන්සිය අයදුම්පත්‍රය සමග ඇමිණිය යුතුය. නැතහොත් කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සරප් වෙත රාජකාරි දිනවලදී උදෑසන 08.30 සිට සවස 15.00 පැය දක්වා මුදල් ගෙවා අදාළ රිසිට්පත අයදුම්පත්‍රය සමග ඇමිණිය යුතුය. (චෙක්පත් සහ මුදල් ඇනවුම් සමග ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.) වැඩි විස්තර - 035 – 2223112

මේ සඳහා අයදුම්පත් නිකුත් නොකරන අතර, අයදුම්කරුවන් විසින් පහත විස්තරවලට අනුකූල වන අයුරින් අයදුම්පත් සකස් කර ගත යුතු වේ.

**ආදර්ශ අයදුම් පත්‍රය**

I. සැපයුම්කරුගේ නම සහ ලිපිනය/ව්‍යාපාරයේ නම සහ ලිපිනය
II. දුරකතන අංකය/ෆැක්ස් අංකය/ඊමේල් අංකය
III. ලියාපදිංචිය අපේක්ෂා කරන සැපයුම/සේවාවේ අංකය හා නම
IV. ව්‍යාපාරයේ වෙළඳ නාමය
(නම් කරන ලද අයිතම නිෂ්පාදනය කරන්නේද යන වග හා දැනට ඉටු කරන කාර්යයන් සම්බන්ධව කෙටියෙන් සඳහන් කරන්න.)
V. වැට් ලියාපදිංචි අංකය
(වැට් සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය)
VI. ව්‍යාපාරික බැංකුව හා ගිණුම් අංකය
VII. ව්‍යාපාරයේ ලිපිනය
VIII. ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ අංකය
(ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකයේ පිටපතක් ඉදිරිපත් කළ යුතුය)
IX. පලපුරුද්ද පිළිබඳ විස්තර( ඇමුණුමක් ලෙස දක්වන්න)
X. ඉදිකිරීම් හා අලුත්වැඩියා ක්ෂේත්‍රයේ CIDA ලියාපදිංචිය පිළිබඳ විස්තර ඇමුණුමක් ලෙස( CIDA ලියාපදිංචිය 2024.12.31 දිනට වලංගු විය යුතුය.)
XI. ගෙවන ලද මුදල
(කුවිතාන්සි ඇමිණිය යුතුය)

ඉහත සඳහන් තොරතුරු මාගේ විශ්වාසය හා දැනීම අනුව නිවැරදි බවට සහතික කරමි.

දිනය:......................                .................................................
අයදුම්කරුගේ අත්සන හා (නිල මුද්‍රාව)

මෙම නාම ලේඛනය ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 3.3 අනුව සීමිත, පාලිත සහ ජාතික තරඟකාරි ලංසු කැඳවීම් ලැයිස්තුවක් ලෙස සැලකීමට අපේක්ෂා කරන බැවින් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සැපයුම්කරුවන්ට මේ සඳහා ලියාපදිංචි වීමට අවස්ථාව ඇති බව දන්වමි.
විශේෂිත අවස්ථාවන් හැරුණුකොට අනිත් සෑම අවස්ථාවකදීම ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ නාම ලේඛනය පදනම් කරගෙන මිල ගණන් කැඳවන බැවින් හා විශේෂිත තත්ත්වයන් නොමැති නම් මෙම නාම ලේඛනය නැවත සංශෝධනය කිරීම වසරකට වරක් සිදුකරන බැවින් ඉහත වැඩ හා සේවා වෙනුවෙන් මිල ගණන් ඉදිරිපත් කිරීමට උනන්දුවක් දක්වන සියලු පාර්ශ්ව මෙහි ලියාපදිංචි වීම අත්‍යාවශ්‍ය බව පෙන්වා දෙමි.
දිස්ත්‍රික් ලේකම් තෑප්තියට පත්වන පරිදි මිල ගණන් ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු අතර, භාරදුන් ඇනවුම් සැපයීමට අපොහොසත් වන සැපයුම් හා සේවාකරුවන්ගේ නම් කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව ලැයිස්තුවෙන් කපා හරිනු ලැබේ. මීට පෙර අප විසින් මිල ගණන් කැඳවන ලද අවස්ථාවලදී සහ ඇණවුම් සම්බන්ධයෙන් නිසි ප්‍රතිචාරයක නොදැක්වූ අවස්ථාවලදී ඔබ ආයතන විසින් මිල ගණන් ලබා දීමට හා ඇණවුම් ලබා දීමට අවස්ථා කිහිපයකදීම අපොහොසත් වී ඇතිනම් එම ආයතන පිළිබඳ ලියාපදිංචියේදී සලකා බලනු නොලැබේ.
ලියාපදිංචිය සඳහා එවනු ලබන අසම්පූර්ණ අයදුම්පත් කිසිදු හේතු දැක්වීමකින් තොරව පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිස්ත්‍රික් ලේකම් සතු වේ.

සියලුම අයදුම්පත් **2024 දෙසැම්බර් 31 දිනට හෝ ඊට පෙර** ලැබෙන සේ **"දිස්ත්‍රික් ලේකම්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කෑගල්ල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ රැගෙනවිත් භාරදිය හැක. අයදුම්පත් එවනු ලබන කවරයේ වම්පස කෙළවරේ "2025 වසර සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු වේ. 2024.12.31 දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් භාර නොගන්නා බවද දන්වා සිටිමි.

**ජේ.එම්.ආර්.පී.ජයසිංහ** **2024.10.23**

**දිස්ත්‍රික් ලේකම් / දිසාපති**

**කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කය**